



# නිවසක් සිත්තම් කරන්නට නම්...

*සටහන: වරලත් වාස්තු විද්‍යාඥ සාගර ජයසිංහ*

කාලයක් පුරාවට සිත් බිමේ මවාගෙන පෙරුම්පිරූ නිවසක සිහිනය, සුන්දර යථාර්ථයක් කරගැනීම සැමගේම පරමාර්ථය යැයි පැවසීම නිවැරදිය. එසේ වුවත් ගල්, වැලි, සිමෙන්ති, ලී, යකඩ ආදී අමුද්‍රව්‍ය රාශියක් එක්තැන් වීමෙන් නැගී සිටින ඔබ අපේක්ෂා කළ නිවසේ සැබෑ ආකර්ෂණය මතු කිරීමට ඒ මත අතුරන වර්ණ සංයෝජනයේ අලංකාරයත් වැදගත් වේ. නවීන නිවසක වුවත් පැරණි නිවසක වුවත් සුදුසු වර්ණ නිසික්‍රමවේදයට ආලේප කිරීමෙන් ඔබේ සිතේ මැවුණු සිතුවම යථාර්ථයක් බවට පත් වනු ඇත.

ඔබේ නිවස වඩාත් සුන්දර මෙන්ම කල්පවත්නා අන්දමින් වර්ණ ගැන්වීමේදී සැලකිලිමත් විය යුතු කරුණු රාශියකි. ඒවා අපට වර්ණ හා බැඳී පවතින මනෝවිද්‍යාත්මක පසුබිම හා වර්ණ ආලේපයේදී භාවිතා වන තාක්ෂණික ක්‍රමවේදය මත බෙදා දැක්විය හැකිය. සමහරවිට එවැනි සියුම් කරුණකින් සිදු කළ හැකි සුබවාදී ප්‍රතිඵල බොහෝය.

නිවසකට වර්ණ තෝරා ගැනීමේදී ප්‍රධාන වශයෙන් එය නිවසේ ඇතුළත සඳහා සුදුසු වර්ණ හා පිටත සඳහා සුදුසු වර්ණ ලෙසින් දෙයාකාරයකට වෙන්කළ හැකිය. නිවසක අභ්‍යන්තරය සැලකීමේදී එහි විවිධ අවකාශ විවිධ ප්‍රමාණයන්ගෙන් සමන්විත වන අතර ඒවා වෙන්වන්නේ, එකිනෙකට වෙනස් වූ කාර්යයන් සඳහාය.

උදාහරණයක් වශයෙන් ඔබගේ නිවසේ සැමදෙනාම එකතු වන ආලින්දය සඳහා වර්ණයක් තෝරාගැනීමේදී සියල්ලන්ම ප්‍රිය කරන මෘදු හා වඩා මිත්‍රශීලිභාවයෙන් යුතු ළා පැහැති වර්ණයක් යොදා ගත හැකිය. එසේම ඔබගේ නිදන කාමරය සඳහා වර්ණයක් තෝරාගැනීමේදී අතිශයින්ම තමන්ගේ පෞද්ගලික

රුචිකත්වයට අනුව ගැළපෙන වර්ණයක් තෝරා ගැනීමේ නිදහස ඔබ සතුය.

ඇතුළත අවකාශයක් වර්ණ ගැන්වීමේදී අවධානය යොමු කළ යුතු තවත් එක් සාධකයක් වනුයේ එහි විශාලත්වය හා ජ්‍යාමිතික හැඩයයි. තද පැහැති වර්ණ යෙදීමෙන් අවකාශයක පරිමාව හා ගැඹුර කුඩාකර පෙන්වන අතර විශාලත්වය හා ආලෝකත්වය වැඩි දියුණු කිරීමට ළා පැහැති දීප්තියෙන් අඩු වර්ණවලට හැකියාව පවතී. එසේම නිසි වර්ණ යෙදීමෙන් ඇතුළත අවකාශයේ ඇති ජ්‍යාමිතික හැඩතල තව තවත් ඉස්මතු කරගත හැකිය.

අවකාශයක පොළවේ හා සිවිලිමේ නිමාව සැලකිලිමත් විය යුතු තවත් කරුණකි. කළුගල් ඇතිරීම හෝ පිඟන් මැටියෙන් තැනූ ටයිල් හෝ සිමෙන්ති නිමාව යනාදී නොයෙකුත් නිමාවන්ගේ ස්වභාවය හා වර්ණ අප විසින් තෝරාගත් වර්ණ සංයෝජනය සඳහා සෘජුවම බලපායි. නිවසට පසුබිම් වූ වාස්තු විද්‍යා සංකල්පයට අනුව අප විසින් යොදා ගැනීමට අදහස් කරන ගෘහ භාණ්ඩ හා ඒවායේ නිමාවද අප විසින් අවධානයට යොමු කළ යුතු තවත් වැදගත් කරුණකි.

අප ඉහතින් සඳහන් කළ කරුණු එකතු වී නිර්මාණය වන අවකාශය සැබවින්ම සිතුවමකට සමාන කළ හැකිය. එම චිත්‍රයේ අපූර්වත්වය රඳා පවතින්නේ ඒ එක් එක් කොටස් සංයෝජනයෙන් මතුකරනු ලබන අලංකාරය මතය. නිවසක පිටතට වර්ණ තෝරා ගැනීමේදී සැලකිලිමත් විය යුතු කරුණු වන්නේ ගොඩනැගිල්ලේ ත්‍රිමාණ ස්වරූපය, එය ගොඩනගා ඇති පරිසරය හා දේශගුණික තත්ත්වය යන සාධකයන්ය.

නිවසේ ත්‍රිමාණ පෙනුම ජ්‍යාමිතික හැඩතල කිහිපයකින් සමන්විත නම් එහිදී ඒවාට වර්ණ කිහිපයක් යොදා ගැනීමෙන් එහි හැඩතල වඩාත් ඉස්මතු කරගත හැකිය. එසේම නිවස අවට ඇති පරිසරය ගැන සැලකීමේදී එය පිහිටා ඇත්තේ නාගරිකවද නැතහොත් ග්‍රාමීයවද යන්න වැදගත් වේ. මෙහිදී ඔබගේ කැමැත්ත පරිදි පරිසරයට ඉතා සමීප වර්ණ එක් කිරීමෙන් එය

**පරිසරයට ඉතා සමීප වර්ණ එක් කිරීමෙන් එය පරිසරයේම කොටසක් ලෙස හෝ හාත්පසින්ම වෙනස් වර්ණ භාවිතයෙන් පරිසරය තුළ වඩාත් ඉස්මතු වී පෙනෙන අයුරින් නිර්මාණය කළ හැකිය.**





වර්ණයේ ස්වභාවය මගින් අවට ආලෝකය අවශෝෂණය කරගැනීමේ හෝ පරාවර්තනය කිරීමේ හැකියාව වෙනස් වේ.



පරිසරයේම කොටසක් ලෙස හෝ හාත්පසින්ම වෙනස් වර්ණ භාවිතයෙන් එය එම පරිසරය තුළ වඩාත් ඉස්මතු වී පෙනෙන ආකාරයට නිර්මාණය කළ හැකිය. විශේෂයෙන්ම නාගරික පරිසරයක පිහිටා ඇති නිවසක් නම් ඔබ අපේක්ෂා කරන සුන්දරත්වය හා ආකර්ෂණයට ප්‍රමුඛතාවය ලබාදෙන අතරම අවට ඇති අනෙකුත් ගොඩනැගිලි සමඟ එය කෙසේ ගැළපෙන්නේද යන්නත් සිතා බැලිය යුතුය. එවිට නිවස තුළ අත්විඳින චමත්කාරය නිවසින් පිටත නගරයේ සැරිසරද්දීත් අත්විඳීමේ භාග්‍ය උදාවනු ඇත.

දේශගුණික හා පාරිසරික සාධකයන් සැලකීමේදී තෙතමනයට ඔරොත්තු දීම, හිරු එළියට නිරාවරණය වීම ආදියද විමසා බැලිය යුතුය. එසේම ගොඩනැගිල්ලේ දිශානුගත පිහිටීමද, එම ස්ථානයට ලැබෙන ස්වාභාවික ආලෝක ප්‍රමාණයද සැලකිය යුතුය. වර්ණයේ ස්වභාවය මගින් අවට ආලෝකය අවශෝෂණය කරගැනීමේ හෝ පරාවර්තනය කිරීමේ හැකියාව වෙනස් වේ. එසේම රළු බිත්තියකින් පරාවර්තනය කරන ආලෝක ප්‍රමාණය සුමුදු බිත්තියකට වඩා අඩුය. එබැවින් බිත්තියක මතුපිට පෘෂ්ඨයේ ස්වභාවයද වර්ණ ගැන්වීමේදී සලකා බැලීම වැදගත්ය.

වර්ණ තෝරාගැනීමේදී අපේ සිතේ ඇඳුණු වර්ණවල එකිනෙකට ගැළපීම පිළිබඳව විමසා බැලිය යුතුය. වඩාත් අර්ථවත් වන්නේ සේවාදායකයා හා වාස්තු විද්‍යාඥයා අතර සම දායකත්වයෙන් හේතු සහිතව වර්ණ තෝරා ගැනීමයි. එම වර්ණ මිලදී ගැනීමේදී වර්ණ කාඩ්පත් පරීක්ෂාකර එක්වරම මිලදී ගැනීම සුදුසු නොවේ. මන්ද වර්ණ කාඩ්පත්වල පෙනෙන අලංකාරවත් බව එම වර්ණ නිවසේ බිත්තිවල ආලේප කළ පසු නොලැබීමට ඉඩ ඇත. එබැවින් පළමුව එම වර්ණ ස්වල්පයක් ගෙනැවිත් බිත්තියේ ආලේප කර සැබෑ පෙනුම දැකබලා ගැනීම වටී. සමහර අවස්ථාවලදී පරණ බිත්තිවල තිබෙන වර්ණය නිසාත් ඔබ ආලේප කරන වර්ණවල සැබෑ වර්ණය යටපත් විය හැකිය. එබැවින් පවතින වර්ණයට වඩා සම්පූර්ණයෙන්ම වෙනස් වර්ණයකට යෑමේදී සුදුසු තාක්ෂණික උපදෙස් ලබාගැනීම වැදගත්ය.

